දෛනික ජීවිතයේදී මව්බිම පාඨකයන් සිහිවට පත් කරන නීතිමය ප්‍රශ්න ගැන සෑම බදාදා දිනකම 'ගෘහිණියන් සඳහාවේ පළිතුරු මුහුණදීම, නීති ආධාර කොමිෂන් සභාවේ විද්‍යාත් නිලංකද කණ්ඩායමක් විසින් එම පිළිතුරු සම්පාදනය කරනු ලැබේ.

ඔබේ ගැටලුව මව්බිම ලීගල් ඒඩ්, නීති ආධාර කොමිෂන් සභාව, 129, මහාධිකරණ සංකීර්ණය, අලුත්කඩේ, කොළඹ 12, දුරකථන 011 2433618 හෝ ඊමේල් legalaidcommission@yahoo.com වෙත යොමු කරන්න.

උපදෙස් සහ ලිප සැකසුම
නීතිඥ දර්ශිකා මඩුගල්ලේ
නීතිඥ ලක්ෂ්මිනී අමරසිංහ
නීති නිලධාරී
නීති ආධාර කොමිෂන් සභාව

01 රිය අනතුරු සම්බන්ධයෙන් වන්දි මුදල් අය කර ගැනීම සඳහා නඩු පැවරිය යුතු කාලය කුමක්ද?

රිය අනතුරු සම්බන්ධයෙන් සිදුවූ හානිය හෝ තුවාල හෝ මියයෑම සම්බන්ධයෙන් හෝ වන්දි ඉල්ලා දීමා අධිකරණයක සිවිල් නඩුවක් පැවරීම සම්බන්ධයෙන් වන විටදී රිය අනතුර සිදුවී වසර දෙකක් ඉක්මවීමෙට පෙර වන්දි ඉල්ලා නඩු පැවරීමේට අදාසත් කරන්නේ නම් නඩු පැවරිය යුතු වෙයි.

මෙම වසර දෙකක කාලය ඉකුත් වීමෙන් පසු එම අනතුර සම්බන්ධයෙන් වන්දි ඉල්ලා නඩු පැවරීමට ඇති අයිතිය ගිලිහී යයි.

02 ඉඩම් සම්බන්ධයෙන් මායිම් නිරවුල් කර ගැනීමට අදාළ නඩු?

ඔබට අයිති ඉඩමේ යම් මායිම් ආරවුලක් පවතින අවස්ථාවකදී දීසා අධිකරණය හමුවට හොත් ඉඩම් නඩුවක් පවරා එම ආරවුල විසඳා ගැනීමට සිදුවෙයි. ඔබ විසින් යම් නිශ්චිත පිළිවැකට අනුව ඔබගේ ඉඩම කුන්ති වී‍දුනු ලැබුවත් අසැරියකි ඉඩම් හිමියන් එහි මායිම් වෙනස් කරමින් ඔබගේ වැට මායිම් කඩා, ඔබගේ ඉඩමෙන් කොටසක් අල්ලා ගැනීමක් කරන්නේ නම් එලෙස අල්ලාගෙන ඇති ඉඩම් කොටස හා මායිම් නිරවුල් කර ගැනීම සඳහා දීසා අධිකරණය හමුවට යා යුතු වෙයි. මෙහිදී අධිකරණයේ අවසරය මත ඉඩම් මැන පැරැණි පිළිවැසස් හා දැනට ඇති මායිම් අනුව මැන අල්ලා ගැනීමක් කොට තිබේ නම් හඳුනා ගනිමින් ගැටලු නිරාකරණය කර ගැනීමට හැකිය.

03 පෞද්ගලික අංශයේ රැකියාවක නියුක්ත වී සිටි අයකු අසාධාරණ සහ අයුක්තිසහගත අන්දමින් රැකියාවෙන් ඉවත් කළ අවස්ථාවක ඔහුට/ඇයට නීතියෙන් පිළිසරණක් තිබේද?

පෞද්ගලික අංශයේ රැකියාවක නියුක්ත අයෙක් අසාධාරණ අයුරින් සේවයෙන් ඉවත් කළ අවස්ථාවක එසේ සේවයෙන් ඉවත් කළ දින සිට මාස හයක් (06) ඇතුලත කම්කරු විනිශ්චය සභාවට ඉල්ලුම්පත්‍රයක් යොමු කිරීම මඟින් නඩු පැවරීමට හැකියාව ඇත.

එම අසාධාරණ සේවා සමාජීය සේවායෝජකයා විසින් ලිඛිතව හෝ වාචිකව සිදුකර තිබිය හැකිය. ඒ කුමක ආකාරයකින් සේවා සමාජීය සිදුකර තිබුණද කම්කරු විනිශ්චය අධිකාරියෙහි නඩු පැවරීම මඟින්

- නැවත සේවයේ පිහිටුවා ගැනීම
- අසාධාරණ සේවා සමාජීය වෙනුවෙන් සාධාරණ වන්දි මුදලක් ලබා ගැනීම වැනි සහන ලබාගත හැකිය.

තවද ආයතනයේ සේවක සංඛ්‍යාව 15ට අඩු නම් එවැනි අවස්ථාවක සේවායෝජක ආයතනය විසින් සේවකයා වෙත ලබා නොදී තිබෙන පාරිතෝෂික දීමනා කම්කරු විනිශ්චය සභාවේ නියෝගයක් මත හිමි කරගත හැකිවේ.

සේවකයන් සංඛ්‍යාව 15ට වැඩි ආයතනයක් නම් එවැනි ආයතනයකින් හිමිවිය යුතු පාරිතෝෂික දීමනා ලබාගැනීම කම්කරු දෙපාර්තමේන්තුව මඟින් සිදුකරගත හැකිය. කම්කරු දෙපාර්තමේන්තුවෙහි අදාළ අංශයෙහි පැමිණිල්ලක් ගොනු කිරීම මඟින් කම්කරු දෙපාර්තමේන්තුව මඟින් විමර්ශනයක් පවත්වා අහිමි කළ පාරිතෝෂික හිමිකර ගත හැකිය.

තවද හිඟ වැටුප්, අතිකාල දීමනා, අධ-වැය දීමනා වැනි සේවකයාට හිමිවිය යුතු වෙනත්පාපිත දීමනාවන් මෙලෙස, කම්කරු දෙපාර්තමේන්තුවේ පැමිණිල්ලක් ගොනු කිරීමෙන් හිමි කර ගත හැකි වේ.

04 කුමන ආකාරයකින්වත් අවලංගු කළ නොහැකි යැයි සඳහන් කළ තෑගි ඔප්පුවක් තෑගි ඔප්පුවෙන් අදාළ දේපළ හිමි කර ගත් තැනැත්තාගේ ආකෘතාඥදාභාව මත අවලංගු කරවීමට නීතියේ පිළිසරණක් තිබේද?

බොහෝ තෑගි ඔප්පුවල සඳහන් වන්නේ එය කිසිසේත් අවලංගු කළ නොහැකි ස්ථිර තෑග්ගක් කොට අදාළ පුද්ගලයාට හිමි කර දෙන බවයි.

නමුත් නවතම නීති තත්ත්වය අනුව තෑගි ඔප්පුවක් ලියා සහතික කිරීමෙන් පසු වසර 10ක් අතුළත හා තෑග්ග ලබාගත් තැනැත්තා විසින් තෑග්ග ලබාදුන් තැනැත්තා කෙරෙහි සිදුකළ ආකෘතඥතා සිදුවී වසර 2ක් තුළ දීසා අධිකරණයේ නඩු පවරා එකී බලවත් ආකෘතඥතාව ඔප්පු කිරීම මඟින් තමා ලබාදුන් තෑගි ඔප්පුව මඟින් හිමි කර දුන් දේපළ නැවත තමා වෙත ලබා ගත හැකිය.

තෑගි ඔප්පුවක් මඟ සටහන් කර තිබෙන ආකාරයට තෑගි ඔප්පුවක් මඟින් යමෙක් තවත් පුද්ගලයකුට දේපළක් තෑගි කරන්නේ නම් ඒ පුද්ගලයා කෙරෙහි තමා තුළ තිබෙන ආදරය කරුණාව, දයාව පදනම් කරගෙනය.

එම නිසා තෑග්ග ලබාගත් පුද්ගලයාගේ බලවත් ආකෘතඥතාව පදනම් කරගෙන තෑග්ග ලබාදුන් පුද්ගලයාට නැවත එම දේපළ තමා වෙත ලබාගත හැකිය.

05 තමාව නිසි පරිදි නඩත්තු නොකරන ස්වාමිපුරුෂයාගෙන් හෝ බිරියගෙන් නඩත්තු ලබා ගැනීම සඳහා අදාළ පුද්ගලයාට නීතියේ පවතින පිළිසරණ කුමක්ද?

නඩත්තු නීතිය (නඩත්තු පනත) අනුව එකී දක්වන්නේ තමාගේ නඩත්තුව තමා විසින්ම කරගත නොහැකි බිරියකට මෙන්ම ස්වාමිපුරුෂයෙකුටද සැලකිය යුතු ආදායමක්/වත්කමක් ඇති අසෙක පාර්ශ්වයේ නඩත්තු ලබාගත හැකි බවයි.

තවද පනත මඟින් දක්වන්නේ මවුපියන් විසින් නඩත්තු නොකරන දරුවන්ටද ප්‍රමාණවත් වත්කමක් ඇති මවුපියන්ගෙන් නඩත්තු ලබාගත හැකිවේ.

ස්වාමිපුරුෂයා සහ බිරිය විසින් නඩත්තු නඩුවක් පවරා නඩත්තු ඉල්ලා සිටින අවස්ථාවක නඩත්තු ඉල්ලා සිටින පාර්ශ්වය අනාචාරයේ ජීවත් වන අයකු නම් හෝ දෙපාර්ශ්වයේ එකඟතාව මත වෙන්ව ජීවත් වන අයකු නම් එවැනි අයකුට නඩත්තු ලබාදීමේ බැඳීමක් නැත.

දරුවකුට වයස අවුරුදු 18 සම්පූර්ණ වන තෙක් තම මවුපියන්ගෙන් නඩත්තු ලබාගත හැකිය.

උසස් අධ්‍යාපනය ලබන වියපත් දරුවන්ට වයස අවුරුදු 25 දක්වා මාවුපියන්ගෙන් නඩත්තු ලබාගත හැකිය.

ආබාධිත දරුවකුට සිය ජීවිත කාලය පුරාම මවුපියන්ගෙන් නඩත්තු ලබාගත හැකිය.

06 කෝවිවිය එන්න පෙර රිංගුවොත් වෙන්නේ මේකයි

2019 අංක 10 දරන මෝටර් වාහන සංශෝධන පනත මඟින් ප්‍රධාන පනතේ 148 වගන්තියට ඉන්විතිව ඇතැළත් කරනු ලැබූ 148 අ (1) වගන්තිය පරිදි කිසිදු තැනැත්තකු විසින්,

(i) දුම්රිය රෙට්ටුව වසා ඇති විටෙක
(ii) දුම්රිය සංඥා පද්ධති නොසලකාහරිමින් හෝ
(iii) බලයලත් නිලධාරියකුගේ විධානයන්ට කීකර නොවෙමින්,

තමාගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ ආරක්ෂාවට අනතුරක් සිදු වීමට ඉඩ ඇති ආකාරයෙන් දුම්රිය හරස් මාර්ගය මත හෝ ඒ හරහා මෝටර් වාහනයක් නොපදවිය යුතුය ලෙස දක්වා තිබේ.

එකී (2) උප වගන්තියේ සඳහන් වන්නේ, (1) වන උප වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන තැනැත්තකු වරදකාර වරදකාර වන අතර එසේ වරදකාරද කරනු ලැබීමේදී රුපියල් විසිපන් දහසකට නොඅඩු හා රුපියල් තිස් දහසකට නොවැඩි දඩයකට සහ දෙවැනි වරට වරදකාරද කරනු ලැබීමේ දී රුපියල් තිස් දහසකට නොඅඩු හා රුපියල් හතළිස් දහසකට නොවැඩි දඩයකට හා මාස හයකට නොවැඩි කාලයක් සඳහා ඔහුගේ රියදැදැර බලපත්‍රය අත්හිටුවීමට සහ තුන්වන හෝ පසු අවස්ථාවකදී වරදකාර කරනු ලැබුවේ නම් රුපියල් හතළිස් දහසකට නොඅඩු හා රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හා මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා ඔහුගේ රියදැදැර බලපත්‍රය අත්හිටුවනු ලැබීමට ඔහු යටත් විය යුතුය ලෙස දක්වා තිබේ.

07 නිවෙසක් බදු දීමේදී නිවෙස් හිමියාට සිය අයිතීන් සුරක්ෂිත කරගනිමින් බදු දීම සිදුකළ හැක්කේ කෙසේද?

නිවෙසක් බදු දීමේදී බදු ඔප්පුවක් සකස් කළ යුතු වේ.

එවැනි බදු ඔප්පුවක්

* බදු කාලසීමාව
* මාසික බදු කුලිය
* ආරක්ෂිත තැන්පතුවක් ලෙස තබා ගන්නා මුදල
* වීදුලි හා ජල බිල්පත් යෙදීම සිදුකරන ආකාරය
* පරිශ්‍රය සෙවණැලිමත කලාකාරීමය අනුගමනය කරමින් පවත්වාගත යුතු බව යසඳමු වදයගත් කොන්දේසි ඇතුළත් කර සකස් කළ යුතු වේ.

තවද අදාළ බදු ගිවිසුම් අවසන් කරගන්නා ආකාරය එනම්, ගිවිසුම් අවසන් කිරීමට අවශ්‍ය පාර්ශ්වය විසින් අනෙක් පාර්ශ්වයට මාස 03ක කල් පූර්ව ලිඛිත දැනුම්දීමක් මඟින් ගිවිසුම් අවසන් කරන බවට කොන්දේසිද ඇතුළත් කර තිබිය යුතුවේ.

බදු ඔප්පුවක් යනු ගිවිසුමක් බැවින් දෙපාර්ශ්වය විසින්ම අදාළ ගිවිසුම් අත්සන් කළ යුතු අතර, සාක්ෂිකරුවන් දෙදෙනකු විසින් අත්සන් කළ යුතු වේ. නොතාර්ස්වරයා විසින් සහතික කළ යුතු වේ.

08 දික්කසාදයක් ලබාගැනීම සඳහා එය අවශ්‍ය පාර්ශ්වය විසින් ගත යුතු නීතිමය ක්‍රියාමාර්ග කුමක්ද?

ස්වාමිපුරුෂයා හෝ බිරිය යන දෙදෙනාගෙන් කවර අයකුට වුවද දික්කසාදය ලබාගැනීම සඳහා ඔහු හෝ ඇය විසින් අදාළ අනෙක් පාර්ශ්වය තුළ පහත කරුණු 3න් 1ක් හෝ පවතින බව මුද්‍රිත වශයෙන් සඳහන් පැවැත්ම සඳහා පෙන්නුම් කළ යුතු වේ. එය සාක්ෂි මඟින් ඔප්පු කළ යුතු වේ.

01. අනාචාරය
02. විනාශ වන අවස්ථාව වන විට පවතින මිනිහක බෙලිහීනතාව
03. ඊර්ෂ්‍ය සහගත අතහැර යෑම

මෙම කාරණා 3න් එකක් හෝ ඔප්පු කරනු ලැබූ අවස්ථාවකදී තමා පදිංචි පුද්ධයේ හෝ අදාළ අනෙක් පාර්ශ්වයේ පදිංචි පුද්ධයේ දීසා අධිකරණයෙහි දික්කසාද නඩුවක් පවරා දික්කසාද ලබාගත හැකිය. ඊර්ෂ්‍ය කාලයක් ස්වාමිපුරුෂයො/බිරියගෙන් වෙන්වී සිටි පමණින් දික්කසාදයක් සිදු නොවේ. ඒ සඳහා දික්කසාද නඩුවක් පැවරීම අත්‍යවශ්‍ය වේ.

09 නඩත්තු නඩුවකදී ඉල්ලීම සනාථ කරන ලේඛන

නඩත්තු නඩුවක් අධිකරණය හමුවේ හොතු කිරීමේදී නඩත්තු ඉල්ලුම්පත්‍රය සමඟ විවුරුම් ප්‍රකාශයක් හොතු කරනු ලබයි. මෙහිදී තවදුරටත් විවාහ සහතික, දරුවන්ගේ උප්පැන්න සහතික ආදියද හොතු කරනු දක්නට ලැබෙයි. නඩත්තු ඉල්ලීමක් කළ විට ප්‍රථමයෙන්ම සිදු කරන්නේ ඉල්ලා ඇති නඩත්තු දීමනාව හොගෙවීමට ඇති හේතු දැක්වීම සඳහා වගඋත්තරකරුට සිතාගි නිකුත් කිරීමයි. පසුව මුල් අවස්ථාවේදීම අතුරු දීමනාවක් ගෙවීමට නියම කරයි. මෙහිදී ඉල්ලුම්පත්‍රය හා විවුරුම් පෙත්සමට අමතරව නඩත්තු ඉල්ලීමක් සම්බන්ධයෙන් වැදගත් ආදායම් වගඋත්තරකරුගේ තහවුරු කිරීමේ ලේඛන ඉල්ලුම්කාර පාර්ශ්වයේ විසඳීම් තහවුරු කිරීමේ ලේඛන යනාදිය හොතු කිරීම වැදගත් වෙයි.

මවුපියන් දරුවන්ගෙන් වන්දි ලබාගැනීමට අදාළ නීතිය

තමාට ජීවත්වීමට හරිහැටි ආදායමක් නොමැති වැඩිහිටියන් හට තමන්ගේ හැසිරවීම අනිත් දරුවන්ගෙන් නඩත්තු ලබාගැනීමට ඉදහකවේ වෘවස්ථාපිත නීතිය අනුව හැසිරවිය හැක්කේ ඇත. 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත නමින් සම්පාදනය කර ඇති විශේෂ නීතියක් මඟින් වැඩිහිටියන් හට මෙම අවස්ථාව සලසා දී ඇත.

අප රටේ මවුපියන් තම දරුවන් තමන් හට කොතරම් නොසලකාහරවියන් දරුවන්ව උසාවියට හෝ පොලිස් ස්ථානය වෙත ගෙන්වන්නට අසැමසිරි බව තමාපය දන්නා කරුණකි. එම නිසා 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් ඒ සඳහා සුදුසු පියවරක් යොදා ඇත. උසාවියක් හෝ පොලිස් ස්ථානයක් හොවන එසේ නමුත් උසාවිය හා සමාන බලයක් ඇති ආයතනයක් වැඩිහිටියන් වෙනුවෙන්ම පණිවුඩ පිහිටුවීමට මෙම පනත මඟින් පිහාරර ගෙන ඇත. එම ආයතනය වැඩිහිටි ඉල්ලීම් මණ්ඩලය ලෙස හඳුන්වනු ලබන අතර එය වැඩිහිටියන්ගේ රහසය භාවය රැකෙන පරිදි පිහිටුවා ඇති ආයතනයකි.

වැඩිහිටි නීතියට අනුව වියපත් මවකට හෝ පියකුට තම දරුවකුගෙන් නඩත්තු මුදල් ලබාගැනීමේ හැකියාව ඇත. එසේම තමන් විසින් හඳුවාඩා ගත් දරුවකුගෙන් ව්‍යවද නඩත්තු මුදල් ලබාගැනීමේ හැකියාව වැඩිහිටි නීතිය අනුව වියපත් වැඩිහිටියකුට ලබාදී ඇත. තවද එක් දරුවෙක්ගෙන් පමණක් නොව දරුවන් කිහිපදෙනකුගෙන් තමන් වෙනුවෙ ලබාගැනීමේ හැකියාව මෙම පනත මඟින් වැඩිහිටියන්ට ලබාදී ඇත.

ස්වකීය නඩත්තුව තමා විසින්ම සපයා ගැනීමට නොහැකි වැඩිහිටියන්ට වැඩිහිටි ඉල්ලීම් මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය. අධිකරණ ක්‍රියාවලිය පදාසිය නොහැකි ආකාරයේ සුහදබැලී අවසන් කිරමිත කරා එළැඹීම වැනි සුවිශේෂී ලක්ෂණ මෙම වැඩිහිටි සභාවේ ක්‍රියාවලිය තුළ දක්නට ඇත.

2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 13 වන වගන්තිය අනුව එකී සභාවේ කාර්යයන් සහ කර්තව්‍යයන් දක්වා ඇත. එනම්,

වැඩිහිටි තැනැත්තන්ගේ සුඛසාධනය සහ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සඳහා අදාළ අත්‍යාසාශය, පළාත් බල මණ්ඩල, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ආගමික ආයතන, රාජ්‍ය හොවන සංවිධානවලින් විමසා අවශ්‍ය වීය හැකි සියලු පියවර ගැනීම.

වැඩිහිටි තැනැත්තන් කෙරෙහි ළමා හා තරුණ පරදුරෙන් ඉදිවිය යුතු යුතුකම් ඔවුන්ට ඔනාව අවබෝධ කරදීමේ අදහසින් පාසල්වල හා වෙනත් සුදුසු ස්ථානවල දේශන, සම්මන්ත්‍රණ, වැඩමුළු සහ වෙනත් වැඩසටහන් සංවිධානය කිරීම.

වැඩිහිටි තැනැත්තන් සම්බන්ධයෙන් වූ අදාළ ජාතික්තර ප්‍රකාශයය සහ සම්මුති ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් පිළිගනු ලබන බවට සහ ඒ අනුව ක්‍රියා කරන බවට වාග බලා ගැනීම.

වැඩිහිටි තැනැත්තන්ගේ ගැටලුවලට බලපාන ප්‍රධාන හේතු සහ ඔවුන්ගේ අවශ්‍යතාවන් හා අභිලාෂයන් හඳුනාගැනීමේ අදහසින් අධ්‍යයනයන් සහ පර්යේෂණ කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

වැඩිහිටි තැනැත්තන් වෙනුවෙන් සෞඛ්‍ය රක්ෂණ සැපිලාභ යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම හා ක්‍රියාවේ පසුවීම.

වැඩිහිටි තැනැත්තන් සඳහා ඇති සේවා සම්බන්ධයෙන් තොරතුරු සැපයීම.

වැඩිහිටි තැනැත්තන්ගේ දැනගැනීම සඳහා වැඩිහිටි තැනැත්තන්ගේ සහත් හැසිරයාවන් හා දක්ෂතා ඇතුළත්කොට ඔවුන් පිළිබඳ නාමාවලියක් පවත්වාගෙන යෑම.

අවශ්‍ය නීති උපදෙස් ලබාගැනීමට වැඩිහිටි තැනැත්තන්ට පහසුකම් සැලසීම සහ සහනයන් ලබා ගැනීමට අවශ්‍ය වැඩිහිටි තැනැත්තන්ට උපකාර කිරීම.

තරුණ පරදුර විශේෂයෙන් සහ ගෙවතුයෙන් යුතුව සිය මිනෙල් විසට ඉතුණුදීම සඳහා ප්‍රදානම් කිරීමේ අරමුණින් විවිධ වැඩසටහන් හඳුන්වාදීම සහ යෝග සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ආරම්භ කොට තරුණ පරපුර එවැනි යෝජනා ක්‍රමවලට දායක වීම සඳහා උනන්දු කරවීම.

නීතිඥ
ගංගා ජයාංගනී සෝමරත්න
නීති නිලධාරී
ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව